# ***බනානා චිප්ස් (Banana Chips)***



## හැඳින්වීම :-

පෝෂණ ගුණයෙන් ඉහළ පළතුරක් වන කෙසෙල් බනානා චිප්ස් ලෙස සකසා ගැනීමෙන්, අපතේ යන කෙසෙල් සඳහා හොඳ වටිනාකමක් ලබාදිය හැක. පහසුවෙන් හා ලාභදායී ලෙස නිෂ්පාදනය කළ හැකි නිසා විදේශීය වෙළඳපොළ තුල මෙය දැනටමත් ජනප්‍රිය අතර, දේශීය වෙළඳපොල තුල ද මේ සඳහා ඉහළ ඉල්ලුමක් ලබාගත හැකි වනු ඇත. විවිධ අයුරින් රස ගන්වා, වෙළෙඳපොළට නිකුත් කළහැකි සරල හා රසවත් ආහාරයක් වන මෙය නියමිත තත්ත්ව යටතේ, ගුණාත්මයෙන් ඉහළ අයුරින් නිෂ්පාදනය කර සුදුසු ඇසුරුමක අසුරා වෙළඳපොලට ඉදිරිපත් කිරීමෙන් හොඳ ආදායමක්ද ලබාගත හැකි වනු ඇත.ප්‍රධාන අමුද්‍රව්‍ය වන කෙසෙල් ගෙඩි තෝරා ගැනීමේදී වඩාත් සැලකිලිමත් විය යුතු වේ. මෙහිදී හොඳට පැසුණු, නොඉදුණු අළුත් කෙසෙල් ගෙඩි වීම ඉතා වැදගත් වේ. තවද, ලෙලි ගැසීමේදී හා පෙති සකස් කිරීමේදී විය හැකි හානි අවම කර ගැනීම පිණිස ඒකාකාර ප්‍රමාණයෙන් හා හැඩයෙන් යුතු කෙසෙල් ගෙඩි තෝරා ගැනීම සුදුසු වේ. විවිධ කෙසෙල් ප්‍රභේද මෙහිදී තෝරාගත හැකි වුවද, අප රටේ මේ සඳහා ඇඹුල් කෙසෙල් වඩා යෝග්‍ය බව පෙනී ගොස් ඇත. මෙලෙස ප්‍රධාන අමුද්‍රව්‍යය නිවැරදිව තෝරා ගැනීම බනානා චිප්ස් නිෂ්පාදනයට වඩා උචිත වේ. මේ සඳහා යොදා ගන්නා ලද තෙල් තෝරා ගැනීමේදී ද විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. සාමාන්‍යයෙන් මෙහිදී බඩඉරිඟු තෙල් (Corn oil) සූරියකාන්ත තෙල් (Sunflower oil) එළවළු තෙල් (Vegetable oil) ආදිය භාවිතයට සුදුසු වේ.

### *අවශ්‍ය ද්‍රව්‍ය :-*

කෙසෙල් ගෙඩි
කල්තබා ගැනීමේ කාරක
ලුණු කුඩු, ගම්මිරිස් කුඩු, මිරිස් කුඩු අවශ්‍ය පරිදි
තෙල් - බැඳ ගැනීමට ප්‍රමාණවත්

### අවශ්‍ය උපකරණ :-

පොතු හරින උපකරණය , පෙති/ කැබලි කපන උපකරණය, ගැඹුරු තෙල් බදින උපකරණය, ඇසුරුම්කරණ උපකරණය , කිරුම් මිනුම් උපකරණය , උෂ්ණත්වමානය , උදුන , මල නොකන වානෙ භාජන / හැදි / පිහි / කපන ලෑලි

**යන්ත්‍ර සහ උපකරණ සඳහා වැය වන මුදල**
75000/= - 100000 /=

## ගැලීම් සටහන

කෙසෙල් ගෙඩි ලෙලි ගැසීම
↓
සිසිල් වතුර බඳුනකට දැමීම
↓
කෙසෙල් පෙති කපා ගැනීම
↓
සාදාගත් ද්‍රාවණයට කෙසෙල් පෙති දැමීම
↓
වතුර බේරෙන්නට හැරීම
↓
ගැඹුරු තෙලේ බැඳ ගැනීම
↓
රස ගැන්වීම
↓
ඇසුරුම් කිරීම
↓
අලෙවිය


**විමසීම් :-**
තාක්ෂණික සේවා අංශය
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
දු. අ. :- 0112 605278
වෙබ් :- www.idb.gov.ik
ෆැක්ස් :- 0112 623846